රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 2/91

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07.
1991 පෙබරවාරි මස 12 දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවල ලේකම්වරුන්,
පළාත් පාලන සභාවල සභාපතිවරුන්, විශේෂ කොමසාරිස්වරුන්,
සහ රාජ්‍ය සංස්ථාවල/ රජයට පවරාගත් සමාගම්/ ව්‍යාපාරික
ආයතනවල සභාපතිවරුන් හා නිසි බලධාරීන් වෙත.

## උසස් තනතුරු දරණ රාජ්‍ය සේවකයින් සඳහා චර්යාධර්ම පද්ධතිය.

අමාත්‍ය මණ්ඩලයේ අධිකාරය යටතේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණ කරන ලද චර්යා ධර්ම පද්ධතිය ආයතන සංග්‍රහයේ කොටසක් බවට පත් කර රජයේ, පළාත් පාලන අංශවල, රාජ්‍ය සංස්ථාවල හා රජයට පවරාගත් සමාගම් ව්‍යාපාරික ආයතනවල උසස් නිලතල දරණ සේවකයින්ට ද අදාල කළ යුතු යැයි රජය තීරණය කොට තිබේ.

02. ඒ අනුව ආයතන සංග්‍රහයට අවශ්‍ය සංශෝධන කිරීමට පියවර ගනු ලැබේ. පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා හා රජයට පවරාගත් සමාගම්/ ව්‍යාපාරික ආයතනවල කාර්ය සංවිධාන සංග්‍රහයන් ද ඒ අනුව සංශෝධනය කිරීමට අදාල බලධාරීන් විසින් කටයුතු කළ යුතුය. අදාල ආචාර ධර්ම පද්ධතියේ ඔබට අවශය මුද්‍රිත පිටපත් සංඛ්‍යාව රජයේ මුද්‍රණාලායාධිපතිගෙන් ලබාගත හැකිය.

අ.කළේ./(ආර්. අබේරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

<u>පිටපත්:-</u>

1. ලේකම්, අධිකරණ අමාත්‍යාංශය,
2. රජයේ මුද්‍රණාලයාධිපති.